The Journal of Archaeology and Heritage Studies (JAHS) 2024: 11 (I) 54-66 pp

The Journal of
ARCHAEOLOGY & HERITAGE STUDIES
Journal Home page http://ssh.rjt.ac.lk/index.php/jahs/

Research Paper

# A Study of the Architectural Peculiarities of the Archaeological Monuments in between the Karanda-Oya and Hada-Oya Valley (based on the Ampara District area)

**B. M. A. Dananjith*[1] and M. P. N. N. Jayasinghe[2]**

[1] Graduate Trainee, Monaragala Project, Central Cultural Fund, Sri Lanka. anjuladananjith20@gmail.com *(Corresponding Author)*

[1-2] Graduate from the Department of Archaeology and Heritage Management, Rajarata University of Sri Lanka, Mihintale, Sri Lanka.

## Abstract

Ampara administrative district has a large number of archaeological monuments. Although there has been some research and excavations on the vast number of monuments there, the main architectural monuments in some selected archaeological monuments between the Karana Oya and Hada oya river valleys flowing through the Ampara administrative district have been carried out. Accordingly, the places chosen were Tharulengala Viharaya, Muhudu Maha Viharaya, Magul Maha Viharaya, Thune Kanuwa, Atgala, Shastravela Viharaya. The aim of the research was to conduct a study on the factors of peculiarities of those aspects through the elements. Here, qualitative research methods were used to collect data, while non-field methods were used to collect data through reference and map study. In data analysis, comparative analysis and data presentation, photographs, maps and plans etc. have been used. The reason for choosing the region among the river valleys indicated above was the increase in the distribution of ancient historical monuments and the fact that they were not much used for research. The buildings seen in the ancient capital city of Anuradhapura have undergone many renovations at different stages, and the original form of the buildings has changed to an unrecognizable level. The original features have been preserved with little or no renovation in the selected temples in this research area. Accordingly, it is possible to identify the oldest stupa in Sri Lanka with the basic form factors of statue, Bodhighara, cave temples, Sanghavasa building or any other building. When we take temples like Tharulengala, Shastrawela, Athgala, Kirivehera, Thune Kanuwa, the buildings there show characteristics that have not been restored and when we examine the organizational pattern of the environment in which these monasteries are located, the monasteries are mainly divided into two parts, formally and non formally organized temples. From this point of view, it can be concluded that the temples within the study area reveal unique architectural features and the original forms of those architectural features have been preserved.

**Keywords** - Ancient Rohana Kingdom, Archaeological Monuments, Karanda Oya, Monastic architecture

ARTICLE INFO

***Article history:***
Article Received: 06 September 2024
Revision Received: 13 April 2025
Accepted: 16 May 2025
Available online: 04 June 2025



*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka.* jahs@ssh.rjt.ac.lk

# කරදඔය සහ හැඩඔය අතරමැදි නිම්නයේ පුරාවිද්‍යා ස්මාරකවල වාස්තුවිද්‍යාත්මක සුවිශේෂතා පිළිබඳ අධ්‍යයනයක් (අම්පාර දිස්ත්‍රික්කය ආශ්‍රිතව)

## 1. හැඳින්වීම

පැරැණි ස්මාරකවලින් පොහොසත් භූමිභාගයක් ලෙස ශ්‍රී ලංකාව හැඳින්විය හැක. මෙම පර්යේෂණයේ අධ්‍යයන කලාපය වන අම්පාර දිස්ත්‍රික්කයේ කරද ඔය සහ හැඩඔය අතරමැදි නිම්නයේ ද ප්‍රකට සහ අප්‍රකට පුරාවිද්‍යාත්මක ස්මාරක විශාල සංඛ්‍යාවක් පවතී. එහි පවත්නා ස්මාරක සංඛ්‍යාව පිළිබඳ මෙතෙක් යම් ප්‍රමාණයක ගවේෂණ සහ කැණීම් කටයුතු සිදු වී තිබුණ ද වාස්තුවිද්‍යා උරුමය සම්බන්ධයෙන් සිදුකරන ලද පර්යේෂණ තොරතුරු අවම බැවින් අම්පාර පරිපාලන දිස්ත්‍රික්කය හරහා ගලා බසින කරද ඔය සහ හැඩඔය ගංගා නිම්න අතර පවතින තෝරාගත් පුරාවිද්‍යාත්මක ස්මාරක කිහිපයක ඇති වස්තුවිද්‍යාත්මක අංගවල සුවිශේෂතා විමර්ශණය කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ. මෙහිදී පර්යේෂණ සීමාව වශයෙන් තරුලෙන්ගල විහාරය, මුහුදු මහා විහාරය, මඟුල් මහා විහාරය, තුනේ කණුව, ඇත්ගාල, ශාස්ත්‍රවෙල විහාරය යන ස්ථාන තෝරා ගන්නා ලදී (සිතියම 01).

පර්යේෂණ මාතෘකාවට සමගාමී ව අධ්‍යයන සීමාවේ සිදුව ඇති පූර්ව පර්යේෂණය සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදී විවිධ විද්වතුන් මෙම පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථානයන් සම්බන්ධව විවිධ කාලවකවානුවලදී විවිධ අර්ථකතන ඉදිරිපත් කර ඇත. මුලින්ම මෙම කලාපය පිළිබඳ ගවේෂණ සිදුකර ඇත්තේ සී. ඩබ්. නිකලස් විසිනි. ඔහු විසින් රාජකීය ආසියාතික සංගමයට 1963දී පළකළ "Historical Topography of Ancient and Medieval Ceylon Volume-VI" තුළින් මඩකලපු දිස්ත්‍රික්කයේ (වර්තමානයේ අම්පාර දිස්ත්‍රික්කය) අප්‍රකට ව පැවැති විහාර ගණනාවක් පිළිබඳ මතුපිට ගවේෂණයක් සිදුකර වාර්තා කර ඇත.

ඉන්පසුව මෙම කළාපය පිළිබඳ සවිස්තරාත්මක ගවේෂණයක් සිදුකර වාර්තා කරනුයේ එල්ලාවල මේධානන්ද හිමිය. "මාගම රාජධානිය" (1970) පලකරමින් මාගම රාජ්‍යයේ ප්‍රභවය සම්බන්ධ මත පලකරන අතර (2012, 67), "නැගෙනහිර පළාත හා උතුරු පළාතේ සිංහල බෞද්ධ උරුමය" (2012) කෘතියෙන් නැගෙනහිර පළාතේ ප්‍රකට හා අප්‍රකට පුරාවිද්‍යාත්මක ස්ථාන පිළිබඳව ගවේෂණාත්මක වාර්තාකරණයක් සිදුකර ඇති අතර පර්යේෂකයා විසින් තෝරාගත් විහාර කිහිපයක් සම්බන්ධයෙන් ද තොරතුරු ඉදිරිපත් කර ඇත (2012, 112-154). "ගවේෂණ තුළ ගවේෂණ" (2016) කෘතියෙහි ද, "ශාස්ත්‍රවෙල මණිනාග පබ්බත බෝධිගිරි විහාරය" (2012) කෘතියෙහි ද විස්තර දක්වා ඇත.

රෝලන්ඩ් සිල්වා විසින් රචිත "Environment, Town, Village and Monastic Planning" (2006) කෘතියෙහි සහ Ancient Ceylon (2004) තුළ පළමු පරිච්ඡේදයේ A Buddhist Monastery type of Ancient Ceylon showing Mahayanist Influence ලිපියෙන් සහ එම කෘතියේ ම Comparison of the Forty Seven "Pancavasa" Monastery Plans with Archaeology Material පර්යේෂණ කළාපයේ විහාරවල වාස්තුවිද්‍යාත්මක අංග පිළිබඳ සාකච්ඡා කර ඇත. ඔහුගේ 'ථූප, ථූපඝර හා ථූප ප්‍රාසාද' (2021) කෘතියේ සඳහන් කරන්නේ මඟුල් මහා විහාරයේ ස්තූපය මෑතකදී බුබ්බුලාකාරව ප්‍රතිසංස්කරණය කර ඇතත් මුලදී ඝටාකාරව පවතින්නට ඇති බවයි. එසේම මෙම ඝටාකාර නිදර්ශනය මෙරට ගිණිකොන ප්‍රදේශයේ පුරාණ රුහුණින් හමුවීම සැළකිය යුතු බවද ඔහු පවසයි (2021,




**සිතියම 01 - කරද ඔය සහ හැඩඔය අතරමැදි නිම්නයේ තෝරාගත් පුරාවිද්‍යාත්මක ස්මාරක ව්‍යාප්තිය (Google Earth)**


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

83). ථූපසර පිළිබඳ තුන්වැනි පරිච්ඡේදයේ දී ලාහුගල වටදාගෙයෙහි සාධක අනුව කාලය අවිනිශ්චිත බව දක්වා ඇත. එයට හේතුව ලෙස දක්වා ඇත්තේ මෙතෙක් ඒ පිළිබඳ පර්යේෂණ කර නොතිබීමය (එම, 72).

අලුත්වැව සෝරත හිමිගේ 'බෞද්ධ රෝහණය' (2014) කෘතියෙහි වඩාත් වැදගත් විග්‍රහයක් දැක්වෙන අතර රුහුණේ පුරාවස්තුවලින් හෙළිවන විශේෂ ලක්ෂණ සහ ඒවායේ අනන්‍යතාවය පිළිබඳ සඳහන් කිරීමේදී විවිධ ප්‍රතිසංස්කරණ හේතුවෙන් අනුරාධපුර නටබුන්වල මුල් ස්වරූපය හඳුනාගත නොහැකි වුවත් රුහුණේ එබඳු ප්‍රතිසංස්කරණයන් අඩුවීම හෝ නොවීම තුළ නටබුන්වල මූලික ස්වරූපය ආරක්ෂා වී ඇති බව සඳහන් කරයි (2005, 75-76).

මධ්‍යම සංස්කෘතික අරමුදලෙන් ප්‍රකාශිත 'පුරාතන' ශාස්ත්‍රීය ලිපි සංග්‍රහයෙහි (2005) නවවන පරිච්ඡේදයේ එනම්, 'කාලායණ කණ්ණිකා හෙවත් පුරාණ නැගෙනහිර කැළණියේ පුරාවිද්‍යා අවශේෂ' මැයෙන් සීවලී බණ්ඩාර මනතුංග සාකච්ඡා කරන අතර එහිදී කලාපයේ පූර්ව පර්යේෂණ හා ඓතිහාසික පසුබිම පිළිබඳ සාකච්ඡා කර ඇත (2005, 75-76).

මෙම කලාපයේ වඩාත් වැදගත් පැරණි වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් සම්බන්ධයෙන් පර්යේෂණ සිදුකරන දනන්ජය ගමලත් විසින් සම්පාදිත 'ප්‍රාතිමෝක්ෂ සහ උපෝසථඝරයේ වාස්තුවිද්‍යා ව්‍යවච්ඡේදනය' (2016) කෘතියේ පංචාවාස විහාර සැලසුම් අනුව සකස් කළ සංඝාරාමයක් තුළ ඇති උපෝසථඝර සම්බන්ධව සිව්වැනි පරිච්ඡේදයෙන් සාකච්ඡා කර ඇත. එහිදී කාලවකවානු අනුක්‍රම අනුව ක්‍රිස්තු වර්ෂ 491-508 පළමුවන ධාතුසේන සහ ක්‍රිස්තු වර්ෂ 659 පළමුවන දප්පුල කාලයට මගුල් මහා විහාරය අයත් බව පවසයි (එම, 84). එහිදී උපෝසථඝරය හස්ත්‍යාරාම සැලසුමේ හර්ම්‍යය නොහොත් උපෝසථඝරය ස්ථානගත වන්නේ අදිති පාදයෙහි බවත් ප්‍රාසාද දොරටුව දකුණු දෙසට යොමුව ඇති බවත් පවසයි (එම, 83). ඒ සම්බන්ධයෙන් සැලසුමක් ද ඉදිරිපත් කර ඇති අතර (එම, 88) උපෝසථඝරයේ එකවර අසුන්ගත හැකි භික්ෂූන් සංඛ්‍යාව 115ක් බවත් දෙමහල් ලෙස ඉදිකර තිබූ බවත් වැඩිදුරටත් සඳහන් කරයි (එම, 98). එහිම පස්වන පරිච්ඡේදයේ එන ග්‍රාමීය (ගාම සීමා) විහාර තුළ ඉදිකර තිබෙන උපෝසථඝර යටතේ මුහුදු මහා විහාරයේ මතුව තිබෙන උපෝසථඝර සාධකය සම්බන්ධව ක්‍රිස්තු වර්ෂ 1-2 සියවස් දක්වා දිවෙන බවත් සඳහන් කරයි (එම, 105). එසේම එහි මිනුම් අනුව සමසතරැස් උපෝසථඝරයක් සහ බිම්මහල පමණක් සහිත එක් වරකදී 16ක් භික්ෂූන්ට අසුන්ගත හැකි ලෙස සකසා ඇති බව පෙන්වයි (එම, 106). මෙම වාස්තුවිද්‍යාත්මක සැලසුම සුවිශේෂ වන්නේ සමසතරැස් උපෝසථඝරයක් වීම බවත් ලෝහ ප්‍රාසාදය සහ බද්ධසීමා ප්‍රාසාදයට පසු තෙවන නිදර්ශකය වන බවත් ඔහු සඳහන් කරයි (එම, 110). Ancient Ceylon (2016) හි පළකරන ලද "ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රතිමා ගෘහ අධිෂ්ඨානයේ බොරදම් රටා විශ්ලේෂණය (ක්‍රි.ව. 2-3 සියවස් සිට 12වන සියවස දක්වා)" යන ලිපිය තුළ මුහුදු මහා විහාර ප්‍රතිමාගෘහයේ පදනමෙහි බොරදම් සහ මගුල් මහා විහාරයේ ප්‍රතිමාගෘහයේ පදනමෙහි බොරදම් පිළිබඳ සාකච්ඡා කර ඇත (2016, 126-131). ඔහු විසින් "ප්‍රතිමාගෘහය තුළ බුද්ධ හා බෝධිසත්ත්ව ප්‍රතිමා තැන්පත් කිරීමේ ක්‍රමවේදය (අනුරාධපුර හා පොළොන්නරු යුගවලට අයත් නිදසුන් ඇසුරින්)" ලෙස The Journal of Archaeology and Heritage Studies, Volume 3-issue 1 හි පළකල ලිපියෙන් තනිවහල සහ ද්විත්ව වහල ක්‍රමයේ සැලසුම්වල බුද්ධ ප්‍රතිමාව දේව පාදයේ ද ඊට සමාන්තර කෝෂ්ඨයන්හි බෝධිසත්ත්ව ප්‍රතිමා තැන්පත් කිරීමේ ක්‍රමවේදයට මුහුදු මහා විහාරය උදාහරණ කරගත හැකි බවත් සංරක්ෂණයේ සිදුවූ වැරදීම් මත බෝධිසත්ත්ව ප්‍රතිමා විපරීත ස්ථානගත කිරීමකට ලක්වී ඇති බවත් සඳහන් කරයි (2016, 80).

මධ්‍යම සංස්කෘතික අරමුදලේ අම්පාර ව්‍යාපෘතිය මගින් මගුල් මහා විහාර භූමියේ 2017 වර්ෂයේ සිදුකළ නව ගවේෂණ කටයුතු සහ ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දැනට හඳුනාගෙන ඇති පුරාවිද්‍යා ස්ථාන පිළිබඳ වාර්තා කර ඇත (මධ්‍යම සංස්කෘතික අරමුදල, අම්පාර ව්‍යාපෘතිය, 2017).

මීට අමතරව පියසේන කහඳගමගේ විසින් 'දිගාමඩුලු දනව්ව' (2007), බෝගහමුල්ලේ සුමන හිමි සහ ලාහුගල පී. බී. දිසානායක විසින් සම්පාදනය කර ඇති 'ලාහුගල මගුල් මහා විහාරය හෙවත් රුහුණේ මහා විහාරය, (2011), දීඝවාපියේ සුසීම හිමි රචිත 'දිගාමඩුලු වන්දනා ගමන්මග' (2011), ඩබ්.එම්. චින්තක සඳරුවන් විසින් රචිත 'පුරාවිතරණ' (2016), චන්දන රෝහණ විතානාච්චි රචිත 'පෞරාණික ස්ථාන සහ ස්මාරක-අම්පාර දිස්ත්‍රික්කය' (2013) ආදී කෘති තුළ අම්පාර දිස්ත්‍රික්කයේ පවත්නා ඓතිහාසික පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන පිළිබඳව ගවේෂණාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත.

යුග වශයෙන් ගත් කල අනුරාධපුර යුගයත් කරඳ ඔය සහ හැඩඔය ගංගා නිම්න අතර පවතින පර්යේෂණය සඳහා තෝරාගත් ඓතිහාසික ස්ථානත් යන සියල්ල බෞද්ධ සංස්කෘතියෙන් පෝෂණය වූ නමුදු ප්‍රාදේශීය වශයෙන් විවිධ වෙනස්කම් සහ ආවේණිකතා සහිත ය. ඒ අනුව එම ස්මාරකවල වාස්තුවිද්‍යාවන්හි ආවේණික සුවිශේෂතා මොනවාද, බෞද්ධ ආගමික සංකල්ප අනුව මෙම විහාරවල ගොඩනැගිලි ස්ථානගත වී පවතීද යන පර්යේෂණයේ ගැටලු ඔස්සේ ද, කරඳඔය සහ හැඩඔය අතර පවතින පුරාවිද්‍යාත්මක ස්මාරකවල වාස්තුවිද්‍යා ලක්ෂණ හා සුවිශේෂිතා පිළිබඳ අධ්‍යයනය කිරීම,


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

ප්‍රාදේශීය ආවේණිකතාවයන් සහ මුල් ලක්ෂණ ඉදිරිපත් කිරීමේ මට්ටම් දැනට සිදුකර ඇති පර්යේෂණ ඔස්සේ විග්‍රහ කිරීම අරමුණ වශයෙන් තබා ගනිමින් ද, මෙම පර්යේෂණය ක්‍රියාත්මක විය.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

මෙහිදී ගුණාත්මක පර්යේෂණ ක්‍රමය ඔස්සේ දත්ත එක්රැස් කිරීමේ ක්‍රම වශයෙන් මූලිකව ම ක්ෂේත්‍ර ගවේෂණය සිදුකරන ලදී. එසේම ක්ෂේත්‍ර නොවන ක්‍රම වශයෙන් මූලාශ්‍ර පරිශීලනය සහ සිතියම් අධ්‍යයනය දත්ත එක්රැස් කිරීම යොදාගන්නා ලදී. දත්ත විශ්ලේෂණයේදී ගුණාත්මක විශ්ලේෂණය ඔස්සේ විශේෂයෙන් විස්තරාත්මක හා සංසන්දනාත්මක විශ්ලේෂණ ක්‍රම උපයෝගී කරගන්නා ලදී.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

### 3.1 ආරාමික සැලසුම්

කරදඹය සහ හැඩඹය නිම්න අතර පර්යේෂණය සඳහා තෝරාගත් ආරාම ස්ථානගත වී තිබෙන පරිසරය පිළිබඳ අවධානය යොමු කළ විට ආරාම වර්ග දෙකක් පිළිබඳ සාධක හඳුනාගත හැකිය.

1. විධිමත් ලෙස සංවිධානය වූ විහාර (Formal Viharas)
2. අනුගත පරිසරයට අනුව සකස් වූ විහාර (Non Formal Viharas)

පර්යේෂණයට බඳුන් කළ විහාර අතර පබ්බත විහාර ලෙස හඳුන්වන විධිමත් ආරාමික සැලසුමකට අයත් විහාර ද්විත්වයක් හඳුනාගැනීමට හැකිවූ අතර ඒ මගුල් මහා විහාරය හා මුහුදු මහා විහාරයයි. මේවායින් එක් වර්ගයක් කඳු පන්තීන් කේන්ද්‍ර කොට නොගෙන තැනිබිමේ ස්ථාපිත කරන ලද සංඝාරාම වර්ගයකි. මංජු ශ්‍රී වාස්තුවිද්‍යා ශාස්ත්‍රයට අනුව මෙම විහාර සඳහා "පංචාවාස" යන නාමය භාවිතා කිරීම සුදුසු බව පෙන්වා දී ඇත (Jayasuriya, Silva & Premathilake, 1995:217-280). ලංකාවේ මේ වර්ගයේ විහාරයන් 47ක් හඳුනාගෙන තිබෙන අතර එහි වඩාත්ම වැදගත්ම ඉදිකිරීම් වන්නේ පූජනීය චතුරශ්‍රය තුළ වන ඉදිකිරීම්ය (Wijesuriya, 1998:52). මෙහිදී එකී සැලැස්ම තුළ මඟුල් මහා විහාරයේ ඇති සුවිශේෂතා කිහිපයක් දක්නට ලැබිණ.

පබ්බතාරාම සැලැස්ම තුළ සභා ශාලාව පිහිටිය යුත්තේ බ්‍රහ්මපාදයේ ය (Silva, 2006: 136). එනමුත් මඟුල් මහා විහාරයේ එවැනි සභා ශාලාවක් දක්නට නොමැති වීම තුළ එහි සුවිශේෂීතාවය ප්‍රකට කරවයි. මෙලෙස තවත් පංචාවාස සංකීර්ණ කිහිපයකම සභා ගෘහය දක්නට නොවේ. විජයාරාමය, පුලියන්කුලම, ප්‍රාචීන තිස්ස පබ්බත විහාරය යන ආරාම සංකීර්ණවල ද මෙම තත්ත්වය දැකිය හැක. පංචාවාස විහාරවලට සභා ශාලාව පසුව එක්කළ ගොඩනැගිල්ලක් වශයෙන් සැලකුණ ද විජයාරාමය හා පුලියන්කුලම වැනි ක්‍රිස්තු වර්ෂ 8 - 10 සියවස්වල උපරිම වර්ධනයක් පෙන්නුම් කළ විහාරවල පවා එම ගොඩනැගිල්ල එකතු නොවී තිබීම සැලකිය යුතු කරුණකි. මේ අනුව දැනට සොයාගෙන ඇති පබ්බත විහාර අතුරින් ස්ථාන හතරක පමණක් (මඟුල් මහා විහාරයේ ද ඇතුළුව ද සභා ශාලාව නොමැත. මෙය දුර්ලභ තත්ත්වයකි).

බැතිමතුන් සඳහා වන්දනාමාන නොකෙරෙන බොහෝ ස්ථානවලින් හමුවන පැරණි උපෝසථඝර ගොඩනැගිලි බැතිමතුන්ගේ මාර්ගයෙන් ඉවත් කර ඇති අතර අනෙකුත් පූජනීය වස්තූන් තුන සමීප ව පිහිටා තිබෙන ආකාරයට සකස් කර ඇත (Silva, 2004:15). පූජනීය චතුරශ්‍රයෙන් පිටත තිබෙන නේවාසික ගොඩනැගිලි සාමාන්‍යයෙන් ඉදිකර තිබෙන්නේ එක හා සමාන ප්‍රමාණ අනුව යමිනි (Jayasuriya, Silva & Premathilake, 1995:52). නමුත් යාවත්කාලීන කරන ලද මඟුල් මහා විහාර ස්ථානීය සැලැස්ම දෙස බැලූ විට එවැනි එක හා සමාන ප්‍රමාණවලින් යුක්ත ගොඩනැගිලි නොමැති බව පෙනී යයි.

මෙම පර්යේෂණයේදී දැකිය හැකි වූ අනෙකුත් ආරාම වර්ගය නම් අවිධිමත් ලෙස සකස් වූ විහාර වේ. කුඩා කඳු හෝ විශාල පර්වත පංතීන් ඇසුරු කර ගනිමින් බිහිකළ බෞද්ධ සංඝාරාම මේ යටතට ගත හැකිය. මේවා වචනාර්ථයෙන්ම පර්වත විහාර ලෙස දැක්විය හැක. ඉන්දියාව තුළ අශෝක රාජ්‍ය සමයේ ප්‍රධාන රාජකීය නගරයෙන් පිටස්තර පළාත්වල බිහිකර තිබූ සියලූ බෞද්ධ ආරාම "ග්‍රාමාරාම" යනුවෙන් හඳුන්වා දී තිබේ (ගමලත්, 2015:104). ශ්‍රී ලංකාව තුළද පරිපාලන දිස්ත්‍රික්ක 16කම ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ සිට ක්‍රිස්තු පූර්ව පළමුවන සියවස දක්වා අයත් පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත පුරාණ විහාර ගණනාවක් හඳුනාගෙන ඇත (එම, 104). රෝලන්ඩ් සිල්වා මෙවැනි විහාර "Non Formal Viharas" යටතට ගෙන විග්‍රහ කර ඇත (2006, 163). ග්‍රාම විහාරවල මූලාරම්භයටත් ඒවායේ අභිවෘද්ධිය සඳහාත් රාජ්‍ය අනුග්‍රහය මෙන්ම රාජ්‍යත්වය හා බැඳුණු ප්‍රභූන්ගේ හා එවැනි නිලතල දැරුවන්ගේ අනුග්‍රහය සෘජුවම ලැබී ඇත (ගමලත්, 2015: 104). තදාශ්‍රිත කලාපයේ තරුලෙන්ගල විහාරය කාවන්තිස්ස රජු විසින් ඉදිකළ බවටත්" ශාස්ත්‍රවෙල විහාරය මහාදාඨික මහානාග රජු විසින් ඉදිකළ බවටත් සෙල්ලිපි සාධක මත හා මහාවංශ තොරතුරු අනුව සනාථ වේ (මහාවංශය, 34 පරි.: 89-90 ගාථා). මහාවංශයේ සුළු වෙහෙර යනුවෙන් හඳුන්වා ඇති මෙම ග්‍රාම විහාර මහා විහාරවලට අනුයුක්ත විහාර වශයෙන් තිබී ඇත (එම,


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

104-105). එමනිසා කුඩා නාගරික කේන්ද්‍රයක් වටා ස්ථානගත වූ මහා විහාර සංවිධානවලින් දුරස්ථව පිහිටි මෙම ග්‍රාම විහාර (එම, 105) අවිධිමත් ආරාමික සැලසුමකින් යුක්ත වේ.

තදාශ්‍රිත කලාපයේ පවතින භූ ලක්ෂණ අනුව විසිරී පවතින කුඩා ශේෂ පර්වත භාවිත කොට සිදුකර ඇති මුල්ම ඉදිකිරීම් වශයෙන් දැකිය හැක්කේ ලෙන් විහාරය. එබඳු ගල්ලෙන් ආශ්‍රිත ව ගොඩනැගුණු විහාර "පර්වත විහාර", "පවත වෙහෙර" යන නම්වලින් හැඳින්විණ (සෝරත, 2014:138). මෙම පර්වත විහාරයක සැකැස්ම කෙබඳුද යන්න අධ්‍යයනයට බඳුන් කරන ලද තරුලෙන්ගල විහාරය සහ ශාස්ත්‍රවෙල විහාරය මගින් අනාවරණය කරගැනීමට හැකිවිය. පුරාණ අනුරාධපුරයට සාපේක්ෂ ව මෙම වර්ගයේ විහාර වැඩිම ප්‍රමාණයක් දක්නට ලැබෙන්නේද මෙම කලාපයේ ය (එම, 139).

ඉහත දක්වන ලද විහාර ද්විත්වය අධ්‍යයනය කළ විට එහි ප්‍රධාන අංග හතරක් දැකගත හැකි විය. එනම්,


- ස්ථූපය
- බෝධිසරය
- ප්‍රතිමා ගෘහය හෝ පිලිමලෙන
- සංඝාවාස

නිශ්චිත සංවිධානගත රටාවක් දක්නට නොලැබුණත් එක්තරා අනුපිළිවෙලක් අනුව බෞද්ධ පූජනීය වස්තූන් ස්ථානගත කර ඇති ආකාරයක් මෙමගින් නිරූපණය වේ (රූපසටහන් අංක 01). පර්වතයේ මුදුනට වන්නට ස්තූපය ඉදිකර ඇති අතර ස්තූපයේ ප්‍රමාණය තීරණය වී ඇත්තේ පර්වතය මත ඇති ඉඩකඩ අනුවය. ඉඩකඩෙහි ප්‍රමාණය මත ශාස්ත්‍රවෙල විහාරයේ ස්ථූප තුනක් ද තරුලෙන්ගල විහාරයේ ස්ථූප දෙකක් ද නිරීක්ෂණය වේ.

ස්ථූපය පිහිටි මට්ටමට තරමක් පහළින් ඉඩකඩ සහිත ස්ථානයක බෝධිය රෝපණය කර තිබිය යුතු වුවද මෙම විහාරයන් තුළ බෝධිසරයක සාධක හඳුනාගත නොහැකි විය. සාධක විනාශ වී හෝ නොමැතිව වුවද ස්තූපයට පහළ මට්ටමක බෝධිය ස්ථානගත කර තිබෙන්නට ඇත. ඊටත් පහළ මට්ටමකින් ලෙන් විහාරය හෝ ප්‍රතිමාගෘහය ස්ථානගත කර ඇත. තරුලෙන්ගල සහ ශාස්ත්‍රවෙල මෙකී ලක්ෂණ දක්නට ලැබුණු අතර පර්වත පාමුල හෝ ලක්ෂණ අනුව පිහිටි ගල්ලෙන් හෝ පර්වත තලා මත හෝ පාමුල තැනිබිම්වල භික්ෂු සංඝාවාස ඉදිවී ඇත. ඒ ආසන්නයේ පොකුණු, සනීපාරක්ෂක ගොඩනැගිලි හෝ ශාලා ඉදිව තිබේ.

ශාරීරික "පාරිභෝගික" උද්දේසික යන බෞද්ධ පූජා වස්තූන් වන්දනා කිරීමේ අනුපිළිවෙල මෙමගින් නිරූපණය වන බව අර්ථකථනය කළ හැකි අතර ස්තූපය ප්‍රමුඛ වන හෙයින් පර්වතය ඉහළ ම කොටසෙහි ද ඊට පහළ මට්ටමක බෝධිය ද, ප්‍රතිමාගෘහය සහ ඊටත් පහළින් සංඝාරාම ඉදිවී ඇත. සරල ලෙස ගොඩනැංවී තිබූ මෙම විහාර කේන්ද්‍ර කොට ගනිමින් කාලයත් සමඟ විවිධ පූජා හා විවිධ අවශ්‍යතා මත විවිධ ගොඩනැගිලි ඉදිවී ඇත. විහාරයේ ලෙන් විහාර ප්‍රතිමාගෘහ ලෙස සංවර්ධනය වූ අතර ධර්ම ශාලා, උපෝසථඝර, සනීපාරක්ෂක කටයුතු සඳහා වැසිකිලි-කැසිකිලි පහසුකම් එසේ ඉදි වූ අංගය (Silva, 2006: 115). සාමාන්‍යයෙන් විහාරවල විවිධ පූජා උත්සව සඳහා දුරබැහැර සිට පැමිණෙන භික්ෂූන්" බැතිමතුන් සඳහා අවශ්‍ය කෙරෙන ගොඩනැගිලි අවශ්‍යතා මෙමගින් පූරණය කෙරිණ (ibid, 115). බුදුන් වහන්සේ විසින් අනුදැන වදාළ ලෙසට පැවිදි ජීවිතය ගත කිරීමට මෙම ලෙන් ආරාම භාවිතා කර ඇත. මෙම විහාරයන් බොහෝ අනුග්‍රහයන් ලැබූ මහා විහාර වැනි විධිමත් ආගමික මධ්‍යස්ථානවලට වඩා බොහෝ සරල විය (ibid, 113).

අධ්‍යයනයට බඳුන් කළ තරුලෙන්ගල සහ ශාස්ත්‍රවෙල ආරාමයන්හි භෞතික වටපිටාව පිළිබඳ




**රූපසටහන 01. පුරාණ පරිසරය හා බැඳි පර්වත විහාරයක ආරාමික සැකැස්ම (Silva, 2017:233)**


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

සලකා බලනවිට ගල් පර්වත, වෘක්ෂලතා, තැනිබිම් ආදී භූ ලක්ෂණ විහාරයේ ඉදිකිරීම් සඳහා උපයෝගී කොට ගෙන තිබෙන බව නිරීක්ෂණය විය. මෙම ග්‍රාමීය නැතහොත් අනුගත පරිසරයට අනුව සකස් වූ විහාර හෝ පර්වත විහාර යනාදී විවිධ නම්වලින් හැඳින්විය හැකි විහාරයන් මගින් ලෞකික සහ ලෝකෝත්තර මානයන් පිළිබිඹු කරන රටාවක්ද පෙන්නුම් කරයි. ස්වභාවික භූ දර්ශනයේ පිහිටීම පදනම් කොට බුදුන් වහන්සේ විසින් අනුදැන වදාළ ගැලවීමේ මාර්ගය නොහොත් නිවන් මඟට පිවිසීම සංකේතාත්මක ව පෙන්වීමත්" ඊට බෞද්ධ පූජා වස්තු සංකල්පය ද ඇතුළත් කර ඇති ආකාරයත් සුවිශේෂී ය.

ඒ අනුව බුද්ධ දර්ශනය පාරිසරික භූ දර්ශනය සමගින් ඒකාබද්ධ වී ඒ හා බැඳී වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් බිහිකර ඇත. ඒ අනුව ශාස්ත්‍රවෙල සහ තරුලෙන්ගල යන විහාරයන් අවිධිමත් ලෙස සැකසුණු විහාරයන් යටතේ සාකච්ඡා කළ ද සුවිශේෂ වාස්තුවිද්‍යාත්මක ස්ථාපනය වීමක් එහි දක්නට ලැබේ.

## 3.2 ගොඩනැගිලි

මෙම කලාපයේ බොද්ධ සංස්කෘතිය පෝෂණය වූ විහාරාරාම තුළ ප්‍රාදේශීය වශයෙන් විවිධ වෙනස්කම් හඳුනාගත හැකිය. ඒ බැවි තදාශ්‍රිතයේ වාස්තුවිද්‍යාත්මක අංග පරීක්ෂා කිරීමෙන් අවබෝධ කොටගත හැක. මෙසේ හඳුනාගත් සුවිශේෂ වාස්තුවිද්‍යාත්මක ගොඩනැගිලි අතර ස්තූප, උපෝසථඝර, බෝධිඝර, ප්‍රතිමාඝර, ලෙන් කර්මාන්ත සහ වෙනත් ඉදිකිරීම් ප්‍රධාන වශයෙන් හඳුනාගත හැකිවේ.

අධ්‍යයනයට බඳුන් කළ විහාරවල ස්තූප මඟින් මෙරට මුල් යුගයට අයත් පැරණි ස්ථූපයක මූලාකෘතිය හඳුනාගත හැකිවේ. තුනේ කණුව, තරුලෙන්ගල, ශාස්ත්‍රවෙල, මඟුල් මහා විහාරය යන විහාර තුළ එවන් ස්තූපයන් හඳුනාගත හැකි වේ. හමුවන සාධක අනුව මෙම ස්තූපවල යූපස්ථම්භවල සාධක දක්නට ලැබේ. දේවතා කොටුව තුළ ඇති වෛදික පූජා ස්ථම්භය යූප ලෙස හඳුන්වනු ලැබේ (සිල්වා, 2021:31). මෙය යෂ්ටි නමිනුත් හඳුන්වනු ලැබේ. යූපය ගත්විට යට කොටස හතරැස් ය. උඩ කොටස මුදුනත දක්වා අටපට්ටම් ය. මුදුන වෘත්තාකාරය (වික්‍රමගමගේ, 2010:59). මෙය හොඳින්ම තුනේ කණුව ස්තූපයේ යූපයේ දක්නට ලැබේ. එසේම තරුලෙන්ගල පාමුල ඇති ස්තූපයේ අටපට්ටම් ලක්ෂණ දරන කැඩී ගිය යූප දණ්ඩකි. මෙහිදී හඳුනාගැනීමට හැකි වූ ස්තූප" එනම් තුනේ කණුව හා මඟුල් මහා විහාරයේ ස්තූපවල තිබී ඇත්තේ එක් ඡත්‍රයක් පමණක් බව කිව හැකිය. ඒ අනුව සිල්වා විසින් ඉහළ කොටසේ නිර්මාණය කළ මෙම නිර්මාණය පිළිබඳ දින නිර්ණය කිරීමේදී ඡත්‍රය හෝ ඡත්‍රය සහිත යූපය ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ සිට ක්‍රිස්තු පූර්ව පළමුවන සියවස හෝ දෙවන සියවසට අයත් කරනු ලබයි (සිල්වා, 2021:38). එසේම ශාස්ත්‍රවෙල විහාරයෙහි හමුවන විශාල ස්තූප සාධකයත් දැනට විනාශ වී ගොස් ඇති පර්වත මුදුන්වල ඇති ස්තූප සාධකත් වෝහාරික තිස්ස රජු විසින් ශාස්ත්‍රවෙල මනිනාග තිස්ස විහාරයේ චෛත්‍ය ඡත්‍ර කර්මාන්ත කරවීම සිදුකළ බව මහාවංශයේ වන සඳහනත් (මහාවංශය, 36 පරි:33-35 ගාථා) සෙල්ලිපි සාධක අනුවත් බැලූ විට විහාරය කරවා ඇති යුගය සම්බන්ධ ක්‍රිස්තු පූර්ව පළමුවන සියවසේ පමණ සිට ක්‍රිස්තු වර්ෂ තුන්වන සියවස දක්වා කාලයට අයත් කළ හැක.

මේ සියළුම ස්තූප පොළොවෙන් ඉහළ අඩි කිහිපයක් උස වේදිකාවක් තනා ඒ මත නිර්මාණය කර ඇත. එහි සාධක වඩාත් හොඳින් මඟුල් මහා විහාරය, තරුලෙන්ගල හා තුනේ කණුව යන ස්ථානවල ස්තූපවල, දක්නට ලැබේ. මෙම ස්තූපයන් ප්‍රධාන වශයෙන් ගඩොලින් ඉදිකර ඇත. සලපතල මළු, පියගැට පෙළි සහ වෙනත් නිර්මාණ ශිලාමය වේ. තරුලෙන්ගල ස්තූපය වටා පදලස් ගල් ස්ථානගත කර ඇත. ප්‍රතිමා වන්දනය ජනප්‍රිය වීමට ප්‍රථම වන්දනා කරන ලද්දේ මෙම මංගල සංකේතයන් ය. මේවා වාහල්කඩ හෝ මළසුන්ගෙය ඉදිකිරීමට ප්‍රථම ස්තූපය වටා තබා බුදුන් සංකේතවත් කරමින් වන්දනා කර ඇත. ඒ අනුව මෙම ස්තූප ද පැරණිම යුගයන්ට අයත් බව සඳහන් කළ හැක.


මඟුල් මහා විහාර ස්තූපය පිළිබඳව සඳහන් කිරීමේදී පසුකාලීනව බුබ්බුලාකාරව ප්‍රතිසංස්කරණය කර ඇතත් මුලදී ඝඨාකාර හැඩයෙන් පවතින්නට ඇති බව රෝලන්ඩ් සිල්වා පවසයි (2021:25). මෙම ඝඨාකාර ස්තූප නිදර්ශන සියල්ලක්ම පාහේ තදාශ්‍රිත කලාපය ද අතීතයේ අයත් ශ්‍රී ලංකාවේ ගිනිකොණ දිග පුරාණ රුහුණින් වීමද සැලකිය යුතු බව ඔහු වැඩිදුර පවසයි (එම, 25).

මෙම ස්තූප අතුරින් වැලිමළුවක් දක්නට ලැබුණු එකම ස්තූපය තුනේ කණුව ස්තූපයයි. එහි සීමා ප්‍රාකාරයක් ද විය. ප්‍රදක්ෂිණා කිරීම සඳහා මෙය යොදාගන්නට ඇති නමුත් මෙතරම් කුඩා ස්තූපයකට මෙවැන්නක් ඉදිකිරීම විශේෂ තත්ත්වයකි. එය ස්තූපයට අලංකාරත්වයක් එක් කර ඇත. ශාස්ත්‍රවෙල පවතින විශාල ස්තූපයේ මළුවේ ජලය බැසයෑමට සකස් කළ ජලනිග්ගමනාලීවල සාධක දක්නට ලැබේ.


ස්තූපයට අදාළ ඉදිකර ඇති සුවිශේෂී වාස්තුවිද්‍යාත්මක නිර්මාණයක් නම් වටදාගෙයයි. මඟුල් මහා විහාරයේ දැනට ප්‍රතිසංස්කරණය කර ඇති පූජනීය චතුරශ්‍රය තුළ ඇති ස්තූපයට අමතරව තවත් ස්තූපයක සාධක හමුවී ඇත (සැලසුම, 01). එය වටදාගෙයක් ලෙස හඳුනාගෙන ඇති අතර රෝලන්ඩ් සිල්වා එම මඟුල් මහා විහාරයේ වටදාගෙයෙහි ලක්ෂණ පිළිබඳව ඔහුගේ නිරීක්ෂණ අනුව,



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk




සැලසුම 01. විහාර සංකීර්ණ කොටසේ වටදාගෙය ලෙස හඳුනාගෙන ඇති ගොඩනැගිල්ල (මධ්‍යම සංස්කෘතික අරමුදල, අම්පාර ව්‍යාපෘතිය, 2018)




සැලසුම 02. විහාර සංකීර්ණ කොටසේ පොහොයගෙය ලෙස හඳුනාගෙන ඇති ගොඩනැගිල්ල (මධ්‍යම සංස්කෘතික අරමුදල, අම්පාර ව්‍යාපෘතිය 2018)

- දාගැබ
- බුදුපිළිම හා ආසන
- ඇතුළු ප්‍රදක්ෂිණා පථය
- වහල දරා සිටින ටැම්
- වහල
- අභ්‍යන්තර ද්වාර හා පියගැට

යන ලක්ෂණ දරන අතර වට පවුර, බාහිර ප්‍රදක්ෂිණා පථය, බාහිර ද්වාර හා පියගැට යන ලක්ෂණ නොමැති බව පවසයි (සිල්වා, 2021: 72-73). එහි ප්‍රධාන ප්‍රවේශ දොරටුව නැගෙනහිර දිශානුගතව පිහිටා තිබේ. එකිනෙකට සමාන්තරව ඇතුළත සහ පිටත වශයෙන් මීටර් 4.5ක් දුරින් ගල්කණු පේළි ද්විත්වයක් දැකගත හැකිය. ප්‍රධාන ප්‍රවේශ දොරටුවේ සිට මීටර් 4ක් දුරින් ස්තූප ගොඩැල්ල පිහිටා තිබේ. මෙතෙක් වාර්තාගතව ඇති පබ්බත විහාරයන්හි ස්තූප පිහිටනුයේ එකක් පමණක් වුවද මෙම විහාර සංකීර්ණයේ දක්නට ලැබෙන වටදාගේ සහිත ස්තූපය එම සම්මතයෙන් පැනගිය දුර්ලභ අවස්ථාවක් වේ.

උපෝසථඝර ගොඩනැගිලිද අධ්‍යයනයට බඳුන් කල විහාර ආශ්‍රිතව දක්නට ලැබුණු අතර මඟුල් මහා විහාරය, මුහුදු මහා විහාරය යන ස්ථානවලින් උපෝසථඝරයන්හි සාධක දක්නට ලැබේ. මඟුල් මහා විහාරයේ ඇති ප්‍රධාන උපෝසථඝර ගොඩනැගිල්ල පූජනීය චතුරශ්‍රය තුළ ස්ථානගත වී පවතී. මෙම විහාරයේම පූජනීය චතුරශ්‍රයට එපිටින් සහ සීමා ප්‍රාකාරයට ද පිටතින් වන්නට විහාර සංකීර්ණය ලෙස හඳුනාගෙන ඇති කොටසේ මධ්‍යම ප්‍රමාණයේ උපෝසථඝරයක සාධක දක්නට ලැබේ. අනුරාධපුර යුගයේ පබ්බත විහාර ගණයට අයත් විහාරයකින් උපෝසථඝර දෙකක් හමුවන ප්‍රථම අවස්ථාව මෙය වේ (සැලසුම, 02). මේ දක්වා එම ලක්ෂණය ඇති මෙම වර්ගයේ සංඝාරාමයක් මෙතෙක් වාර්තා වී නොමැත. මෙසේ උපෝසථඝර දෙකක් ස්ථානගත වීම ප්‍රාතිමෝක්ෂ ව්‍යවස්ථාව ප්‍රාකාරව ඇති "උපෝසථඝර අයනිය" බිඳී යන අවස්ථාවක් වශයෙන් පෙන්වා දිය හැකිය (ගමලත්, 2015: 17, 25, 76, 82). එනම් ප්‍රාතිමෝක්ෂ නියතීන්හි ඇති "ඒකෝ උපෝසථඝර" නියතිය බිඳී යයි. ථෙරවාදී බුදුදහමට අනුව ප්‍රාතිමෝක්ෂ නීති ප්‍රකාරව එය සිදු නොවිය යුත්තකි (එම, 76). විනය උපදේශයන්හි නිරතුරුවම


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk


සඳහන් කෙරෙන්නේ උපෝසථ කර්මය සෑම විහාරයකම ඒ සඳහා වෙන් කළ නිශ්චිත ගෘහයක් තුළ සිදුකළ යුතු බවයි (එම, 17). එම නිසා මෙම කටයුත්ත වෙනුවෙන් පිහිටවන ලද එක් උපෝසථඝරයක් තුළ පමණක් ම කළ යුතුවේ (එම, 17). සංඝාරාමය කෙතරම් විශාල වුවද වසන සියලූ උපසපන් භික්ෂූන් එහි උපෝසථ කර්ම කළ යුතු බව එයින් වැඩිදුරටත් පෙනී යයි (එම, 17).

විහාරවල ඛණ්ඩ සීමා පිහිටුවා ඒවායේ උපෝසථඝර තැනවීමේ අවශ්‍යතාවය අනුව අවසර ලබා දී ඇත. සියලූම විහාරාංග සහිත භූමියක ඛණ්ඩ සීමා සම්මත කිරීමේදී බොහෝ දෙනා නොහැසිරෙන විහාර භූමිය කෙළවරක විවේකාශ්‍රයක මෙය සම්මත කළ යුතුය (එම, 25). ඒ අනුව උපෝසථඝරය ස්ථානගත වී ඇති ස්ථානය ඉහත ප්‍රකාශය සමග හොඳින් ගැලපේ.

කිසියම් විහාරයක උපසපන් භික්ෂු සංඛ්‍යාවෙහි වර්ධනයක් වී නම් එහි ඇති පොහොයගෙයහි ඉඩකඩ මද වන අවස්ථාවකදී ඛණ්ඩ සීමාස්ථ උපෝසථඝර දෙකක් තනි විහාරයක ඇතිවිය හැක. මෙරට ක්‍රිස්තු වර්ෂ 9 - 10 සියවසින් පසු ආලාහන පිරිවෙන හා පඬුවස්නුවර වැනි ස්ථානවලින් ඛණ්ඩ සීමා උපෝසථඝර ඉදිකර ඇත. නමුත් පබ්බත විහාරයක උපෝසථඝර දෙකක් දක්නට ලැබෙන ප්‍රථම අවස්ථාව මෙය වේ. උපෝසථඝර නොමැති සංඝාරාමවල භික්ෂූන් ද පොහොයකර්ම සඳහා එම විහාර අනුයුක්ත කර ඇති විහාරවලට රැස්විය යුතු අතර එවැනි විටකදී පවතින උපෝසථඝරයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවේ. එහිදී මෙම ඛණ්ඩ සීමා උපෝසථඝර භාවිතයට ගන්නට ඇත. මෙම උපෝසථඝරය පිහිටුවා ඇත්තේ ද ඛණ්ඩ සීමාවකය. මෙම ගොඩනැගිල්ලේ ප්‍රධාන ප්‍රවේශයේ දකුණු දිශානුගතව පිහිටා තිබේ. මධ්‍යයට වන්නට මීටර් 3x3 ප්‍රමාණයේ ශාලාවක් පැවැති බවට සාධක දැකිය හැක. පිටත සහ ඇතුළත වශයෙන් ගල්කණු පේළි ද්විත්වයකි. එක් පෙළකට ගල්කණු අට බැගින් පවතින්නට ඇතැයි සිතිය හැකිය (මඟුල් මහා විහාර ව්‍යාපෘති වාර්තාව-2018).

උපෝසථඝර ගොඩනැගිල්ලක් දැකිය හැකි අනෙකුත් විහාරය නම් මුහුදු මහා විහාරයයි. එහි දිග සහ පළල මීටර් 4.70x4.70 ප්‍රමාණ වේ (ගමලත්, 2015:106). සමචතුරස්‍රාකාර වන මෙම ගොඩනැගිල්ල බිම් මහලක් පමණක් සහිතව ගොඩනඟා ඇති අතර 16නමක් භික්ෂූන් සඳහා අසුන් ගතහැකි උපෝසථඝරයක් ලෙසද හඳුන්වා ඇත (එම, 106). කාලවකවානු පෙළගැස්මට අනුව මුහුදු මහ විහාරයේ උපෝසථඝරය අනෙක් සියලූම උපෝසථඝර අතරින් වැදගත්කමක් හිමිකර ගනී (එම, 110). මෙහි ඇති බිම් සැලසුම චතුරස්‍රාකාර හැඩයෙන් යුක්ත වන අතර දිවයිනේ මෙතෙක් අවධානයට බඳුන්ව තිබෙන චතුරශ්‍ර සැලැස්මකින් යුතු ප්‍රධාන උපෝසථඝර දෙක එනම් ලෝහප්‍රාසාද උපෝසථඝරය හා බද්ධ සීමා ප්‍රාසාදය හැරුණු විට මෙය තෙවන නිදර්ශකය වේ (එම, 110). රළු නිමාවකින් යුක්ත වන මෙහි ගල්කණුවක් උපරිම උස මීටර් 2ක් පමණ වේ (එම, 110). එක් පසෙකට පේළි හතර බැගින් කණු පිහිටුවා ඇත්තේ මධ්‍ය ශාලා අවකාශයක් ද ඇති වන ලෙසය (එම, 110). චතුරශ්‍ර උපෝසථඝර සැලසුම විග්‍රහ කෙරෙනුයේ ථෙරවාදී දර්ශනය මත පදනම්ව සැලසුම් කරනු ලැබූ උපෝසථඝර සැලසුම වශයෙන් බව ගමලත් පවසයි (එම, 111).


මුහුදු මහා විහාර උපෝසථඝරය තුළ එක් සභා වාරයකදී වාඩිවිය හැකි භික්ෂූන් සංඛ්‍යාව 16ක් වශයෙන් ගණනය කරන විට පෙනී යන්නේ එම සංඛ්‍යාව ප්‍රාතිමෝක්ෂ විනිශ්චයේ නියම කර ඇති උපෝසථ කර්ම සඳහා ඛණ්ඩ සීමාවක් තුළ සහභාගි විය යුතු අවම සංඛ්‍යාව වන 21කට වඩා අඩුවීමකි (එම, 111). බද්ධ සීමා සම්මතයේදී අත්හළ යුතු අයෝග්‍යතා 11 අතර ඉතා කුඩා සීමාව (අති ඛද්දිකා) එනම් විසි එක් නමකට අවකාශ නොමැති සීමාව අයෝග්‍ය සීමාවක් වේ (එම, 21). ඒ අනුව ඉඩකඩ අවම වශයෙන් 21නමකට ප්‍රමාණවත් විය යුතුය. මෙවැනි තවත් අඩු ප්‍රමාණයේ උපෝසථඝරයක් ඇත්තේ නාගලකන්දේ පමණි. වාඩිගත හැකි භික්ෂූන් සංඛ්‍යාව 15කි (එම, 111). මහා විහාරයන්හි, පබ්බත විහාරයන්හි සහ ග්‍රාමීය විහාරයන්හි උපෝසථඝර සඳහා මංජු ශ්‍රී වාස්තුවිද්‍යා ශාස්ත්‍රයෙහි එන නිර්දේශිත මිනුම් සමග, ඒ අනුව යමින් ඉදිකර තිබුණද මුහුදු මහා විහාරයේ සමසතරැස් සැලසුම එකී සම්මතයන් බිඳ දැමූ අවස්ථාවක් වශයෙන් දැක්විය හැක (සැලසුම, 03).





**සැලසුම 03. මුහුදු මහා විහාරයේ චතුරස්‍රාකාර උපෝසථඝර සැලසුම (ගමලත්, 2015: 107)**




*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka.* jahs@ssh.rjt.ac.lk




**සැලසුම 04. ත්‍රියත සැලසුමට අනුව ප්‍රතිමා පිහිටුවීම (ගමලත්, 2015: 79)**



**සැලසුම 05. මහුල් මහා විහාර ප්‍රතිමාගෘහයේ බොරදම (ගමලත්, 2016: 127)**




**සැලසුම 06. මහුල් මහා විහාර බෝධිඝරයේ සැලසුම. (මහුල් මහා විහාර ව්‍යාපෘති වාර්තාව 2018)**

බුද්ධ ප්‍රතිමාගෘහයක ප්‍රතිමාව සැමවිටම තැන්පත් කෙරෙනුයේ ගර්භ ගෘහයේ ය. බුද්ධ ප්‍රතිමා සහ බෝධිසත්ත්ව ප්‍රතිමා තැන්පත් කිරීමේ ක්‍රියාවලිය සිදු කෙරෙන්නේ කිසියම් නිශ්චිත පිළිගත් න්‍යායික ප්‍රවේශයක් මත පදනම් වෙමිනි (ගමලත්, 2016:75). ත්‍රියත, පරමශාක්‍ය, මණ්ඩුක, ස්ථන්තිල යනාදී වශයෙන් ප්‍රතිමා තැන්පත් කෙරෙන සැලසුම් හතරක් වේ. මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා ශාස්ත්‍රය සහ චිත්‍රකර්ම ශාස්ත්‍රය අනුව මුහුදු මහා විහාරය සහ මහුල් මහා විහාරයේ ඇති ප්‍රතිමාඝර සැලසුම් තනි වහල හෝ ද්විත්ව වහල සැලසුම් ක්‍රමයන් විය හැක (එම, 75). එම ශාස්ත්‍රයන්ට අනුව තනි වහල ක්‍රමයේ සහ ද්විත්ව වහල ක්‍රමයේ සැලසුම්වල බුද්ධ ප්‍රතිමාව දේවපාදයේ තැන්පත් කළ පසු දෙපැත්තේ එම පාදයේම ඊට සමාන්තර කෝෂ්ඨයන්වල බෝධිසත්ත්ව ප්‍රතිමා තැන්පත් කිරීමේ ක්‍රමවේදය දැකගත හැකිය (එම, 75).

නමුත් ඉහත කී නිර්දේශිත ක්‍රමවලින් බැහැර වෙමින් ගමන් කළ සැලසුම් ද දක්නට ලැබේ. ත්‍රියත, පරමශාක්‍ය, මණ්ඩුක යන සැලසුම් තුනේම ප්‍රධාන පිළිමය දේවපාදයේ හරි මැද කෝෂ්ඨයේ තබා ඊට සමාන්තර කෝෂ්ඨයන් තුළ වෙනත් ප්‍රතිමා තැන්පත් කළ නොහැක. මෙම සැලසුමින් පිට පැනගිය මුළුමනින්ම විපරීත ප්‍රතිමා තැන්පත් කිරීමක් මුහුදු මහා විහාර ගර්භ ගෘහයෙන් අනාවරණය වන බව ගමලත් පවසයි (එම, 80). එහි බෝධිසත්ත්ව ප්‍රතිමා බුද්ධ ප්‍රතිමාව දෙසට මුහුණලා ඊට ඉදිරියෙන් තැන්පත් කර තිබෙනු දැකිය හැක. මෙය මුල් ස්ථානවල නොව පසුව සිදුකළ සංරක්ෂණවලදී වරදවා තැන්පත් කිරීමක් බව සඳහන් කොට ඇත (එම, 80).

පුරාණ ප්‍රතිමාගෘහවල අධිෂ්ඨානය හෙවත් පදනමේ දිස්වන අලංකාර බොරදම් රටාවල මූලාරම්භය පිළිබඳ අධ්‍යයනය කරන ගමලත් මංජු ශ්‍රී වාස්තුවිද්‍යා හා චිත්‍රකර්ම ශාස්ත්‍රයන්හි නිර්දේශිත බොරදම් හැඩ රටාවන් මහුල් මහා විහාරයෙහි දක්නට ලැබෙන බව පවසයි (ගමලත්, 2016:126). මහුල් මහා විහාරයේ ප්‍රතිමාගෘහයේ ගර්භගෘහය නිර්මාණය කර ඇති අමුද්‍රව්‍ය ගඩොල් වන අතර පදනමේ උස මීටර් 0.80කි. ජගති, අලිංග, කපෝත, ආලිංග, කණ්ඨ, වේත්‍ර, කුමුද, ප්‍රති Ovolo Reverce, පට්ටිකා වශයෙන් බොරදම් අනුපිළිවෙල සකස් වී ඇත (සැලසුම 05). එසේම මධ්‍ය අධිෂ්ඨානයේ උස මීටර් 0.60 හා උපපාදුක, ජගති, පද්ම, වේත්‍රක, පට්ටිකා, කපෝත, ආලිංග, කණ්ඨ, පට්ටිකා යන බොරදම් අනුපිළිවෙල දක්නට ලැබේ (එම, 151-155).

වැඩිදුරටත් ඒ පිළිබඳ සඳහන් කරන ගමලත් පවසා සිටින්නේ මහුල් මහා විහාර ප්‍රතිමා අධිෂ්ඨානයේ කපෝතය මත උඩින් වැඩි කණ්ඨය යොදා ඒ මත විස්තාරිත කුමුද බොරදම යොදා තිබෙනුයේ පද්ම



JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

බොරදම නොමැතිවය (එම, 131). මෙහි කපෝතය වැනි වක්‍ර හැඩ බොරදම් සහ කුමුද බොරදම් කණ්ඨයට සම්බන්ධ කෙරෙනුයේ උසින් වැඩි ආලිංග සහ වාජන බොරදම් යොදාගනිමිනි (එම, 131). දැනට ලංකාවේ මෙම ලක්ෂණය දක්නට ලැබෙන්නේ මහුල් මහා විහාර ප්‍රතිමාගෘහයෙනි (එම, 131). ඒ අනුව මහුල් මහා විහාර මණ්ඩප අධිෂ්ඨානය තරමක් වෙනස් ආකාරයට වාජන බොරදම අව්‍යක්ත ලෙසට යෙදූ බව පෙනේ (එම, 138). ඒ අනුව මෙම බොරදම් සුසංයෝගය වඩාත් විසංවාදී සහ වෙනස් සංකලනයක් නිරූපණය කරයි (එම, 139).

බෝධිඝර නිර්මාණ සාධක දක්නට ලැබෙනුයේ මහුල් මහා විහාරයෙන් පමණි. මෙම බෝධිඝරය මෙරට හමුව ඇති අනෙකුත් පැරණි බෝධිඝර හා සංසන්දනය කිරීමේදී වාස්තුවිද්‍යාත්මක වශයෙන් සුවිශේෂී වැදගත්කමකින් යුක්ත වන බව සඳහන් කළ යුතුය. මෙරට හමුවන නිල්ලක්ගම, මහා විහාර ආදී චතුරශ්‍රාකාර සහ වෘත්තාකාර බෝධිඝරවලට වඩා වෙනස් ඉදිකිරීම් ශෛලියක් අනුගමනය කර ඇති අතර බෝධිය රෝපණය කර ඇති කොටුව වෘත්තාකාර ලෙස නිර්මාණය කර ඇත (බණ්ඩාරනායක, 1985:37). සමස්ත බෝධිඝරයම පද්මයක ආකාරයකින් නිරූපණය වේ (සැලසුම 06). මෙම හැඩය ප්‍රාචීන තිස්ස පබ්බත විහාරයේ බෝධිඝරයේ සැලසුමට සමාන වන නමුත් බෝධි වටය වෘත්තාකාර වෙනත් බෝධිඝරයක් අන් තැනක නොමැත. බෝධිඝර ප්‍රාකාරය වටාම වාඩිවී සිටින සිංහ රූ සහ පලාපෙති කැටයම් සහිත බොරදම් කැටයම් වේ.

පර්යේෂණය තුළදී දක්නට ලැබුණු වාස්තුවිද්‍යාත්මක අංග අතර ඕවලාකාර හැඩයට ආසන්න දෙපස වටකුරු කරන ලද පදනමක් සහිත ගොඩනැගිලි විශේෂයක සාධක දක්නට ලැබිණ. ඇත්ගාල නමින් හඳුන්වන ස්ථානයේ මහුල් මහා විහාරයේ වටදාගෙය ලෙස හඳුනාගෙන ඇති ස්ථානයේ මෙම හැඩයන් නිරීක්ෂණය විය (සැලසුම 01 සහ රූපසටහන 02). මෙවැනි වටකුරු ගොඩනැගිලි පර්යේෂණ කලාපය ආසන්නයේ පිහිටි පුලුකුණාව බෝධිඝර ගොඩනැගිල්ල, රජගල දාන ශාලා ගොඩනැගිල්ල තුලින් ද හමුව ඇති හෙයින් මෙවැනි ඉදිකිරීම්වල ප්‍රාදේශීය අනන්‍යතාවයක් දක්නට ලැබේ. දැවයෙන් කළ ඉලිප්සාකාර ගොඩනැගිලි සැලසුම් ඉන්දියාවේ මෙන්ම ශ්‍රී ලංකාවේ ද පවතී. නමුත් ගලින් කල කෙළවර වෘත්තාකාර කළ සැලසුම් සම්බන්ධයෙන් මෙය වෙනස් වේ. අනුරාධපුර මහා විහාර සම්ප්‍රදායන්හි පවතින චතුරශ්‍රාකාර, ආයත චතුරස්‍රාකාර හෝ වෘත්තාකාර ගොඩනැගිලි මෙන් නොව දෙපස වටකුරු කරන ලද මෙම ගොඩනැගිල්ල ප්‍රාදේශීය ආවේණිකතාවයක් ගැබ් කොටගෙන ඇති බව හැඳින්වීම සුදුසුය.






**ඡායාරූපය 01.** ඇත්ගාල ගල් බැමි (ඉහළ) සහ රූපසටහන **02.** ස්ථානීය සැකැස්ම (පරිමාණයට නොවේ)

භික්ෂූන් සඳහා ඉදිකල නේවාසික ගොඩනැගිලි මහුල් මහා විහාරය, තරුලෙන්ගල සහ ශාස්ත්‍රවෙල යන විහාර තුළ දක්නට ලැබිණ. මහුල් මහා විහාරයේ නේවාසික ගොඩනැගිලි පූජනීය චතුරශ්‍රයට පිටතින් සහ සීමා ප්‍රාකාරයට ඇතුළතින් ස්ථානගත වී ඇති අතර චතුරශ්‍රාකාර සහ ආයත චතුරශ්‍රාකාර ගොඩනැගිලි ගණනාවක් දක්නට ලැබී ඇත. ඒ අතර කැසිකිළි ගොඩනැගිලි ද වේ. ශාස්ත්‍රවෙල විහාරයේ පර්වත තලාවන්හි සහ පර්වත පාමුල ගලින් කල ගොඩනැගිලි පදනම් දක්නට ඇත. තරුලෙන්ගල විහාරයේ භික්ෂූන් විසින් ප්‍රයෝජනයට ගන්නා ලද කැසිකිළි ගොඩනැගිලි වේ. එහි අපද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා කාණු පද්ධති ද සකස් කර ඇත. හමුවන කැසිකිළි ගල් සාදක අනුව මෙම විහාරයේ භික්ෂුණී ආරාමයන් ද පවතින්නට ඇතැයි උපකල්පනය කළ හැක. අනුරාධපුර මහා විහාරය හෝ අභයගිරි හෝ ජේතවන හෝ හමුවන වැසිකිළි ගල් හෝ කැසිකිළි ගල්වල ඇති සුන්දර කැටයම් මෙන් නොව මෙම විහාරවල ඇත්තේ සරල, අවශ්‍යතාවය මත පදනම් ව නිර්මාණය කෙරුනු ඒවාය.

මෙම විහාර අතුරින් මහුල් මහා විහාරය හැරෙන්නට අනෙකුත් විහාරවල වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් නැවත


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

ප්‍රතිසංස්කරණය වීමේ සාධක අඩු හෝ නොමැති තරම් ය. මඟුල් මහා විහාරයෙන් ලැබී ඇති ශිලාලිපි බොහොමයක් මගින් මෙම විහාරය කිහිප වාරයකදීම ප්‍රතිසංස්කරණය වූ බවට හමුවන නටබුන් අනුව නිරීක්ෂණය වේ. ස්තූපයේ ඇති සලපතල මළුවෙන් සහ පිළිමගෙය අසලින් හමුවන ක්‍රිස්තු වර්ෂ 9 - 10 සියවස්වලට හා 14වන සියවස්වලට අයත් ශිලාලිපි ඒ බැව් සනාථ කරවයි. ඒ අනුව මුල් ඉදිකිරීම් ක්‍රිස්තු වර්ෂ 5 - 6 සියවස්වලටත්, දෙවන ප්‍රතිසංස්කරණයන් ක්‍රිස්තු වර්ෂ 9 - 10 සියවස්වලටත්, අවසාන ප්‍රතිසංස්කරණයන් ක්‍රිස්තු වර්ෂ 14වන සියවසටත් අයත් කළ හැක.




**සැලසුම 07. ගවේෂණ මගින් යාවත්කාලීන කළ විහාරයේ ස්ථානීය සැලසුම. මධ්‍යම සංස්කෘතික අරමුදල. අම්පාර ව්‍යාපෘතිය (2018)**

මඟුල් මහා විහාරයේ පබ්බත විහාර ලක්ෂණ පෙන්නුම් කරන නමුත් අනෙකුත් පබ්බත විහාරවල මෙන් දානශාලාව හා ජන්ථාඝරය යන ගොඩනැගිලි මෙතෙක් හඳුනාගෙන නොමැත. පූජනීය චතුරශ්‍රය තුළ දක්නට ලැබිය යුතු ප්‍රධාන ආගමික ගොඩනැගිලි පහෙන් එකක් වන සභා ගොඩනැගිල්ල මෙහි දක්නට නොවේ (සැලසුම 07). දකුණු දිශාවට දොරටුවක් පිහිටිය යුතු සභා ගොඩනැගිල්ල බ්‍රහ්මපාදයේ පිහිටිය යුතු වුවත් එය දක්නට නොවීම දුර්ලභ ලක්ෂණයකි.

වරින් වර සිදුවන ප්‍රතිසංස්කරණවලට භාජනය වී තිබීම නිසා අනුරාධපුර අගනගරයේ සහ ඒ තදාශ්‍රිත කලාපයන්හි පැවති විහාරයන්හි වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම්වල මුල් ස්වරූපයන් හඳුනාගත නොහැකි මට්ටමක පැවතුණ ද පර්යේෂණයට බඳුන් කල සීමාවේ දක්නට ඇති වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම්වල ප්‍රතිසංස්කරණයන් අඩුවීම හෝ නොවීම නිසා ඒවායෙහි මූලික ස්වරූපය බොහෝදුරට ආරක්ෂා වී ඇත. ඒ අනුව ලංකාවේ පැරණිතම ස්තූපයක, ප්‍රතිමාගෘහයක, බෝධිඝරයක, ලෙන් විහාරයක, සංඝාවාස ගොඩනැගිල්ලක හෝ වෙනත් ගොඩනැගිල්ලක මූලික ආකෘති සාධක සහිතව මෙහිදී හඳුනාගැනීමේ ශක්‍යතාවය පවතී.

## 4. සමාලෝචනය සහ නිගමනය

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයෙන් ගලා බසින හැඩඔය සහ කරඳ ඔය යන ගංගා නිම්නයන් අතර පිහිටි පුරාවිද්‍යාත්මක ස්ථාන 6ක් ඔස්සේ මෙම අධ්‍යයන සිදුකර ඇත.

ප්‍රාග් ඓතිහාසික අවධියේ සිට යටත්විජිත අවධිය දක්වා වන පුළුල් ඓතිහාසික සන්දර්භයක් සහිත පර්යේෂණ සීමාව තුළ කැපීපෙනෙන ලෙස මානව ක්‍රියාකාරකම් සිදුවූ කාලවකවානුව වශයෙන් මුල් ඓතිහාසික අවධිය එනම් ක්‍රිස්තු පූර්ව තුන්වන සියවසේ සිට මධ්‍ය ඓතිහාසික අවධිය එනම් ක්‍රිස්තු වර්ෂ 6 - 9 සියවස් අතර කාලය වන බව ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාධක අනුව හඳුනාගත හැකිවිය. මෙම කාලවකවානුව තුළ ථේරවාදී බෞද්ධ දර්ශනය මූලික කොටගත් විහාර ආරාම සමග අනන්‍ය වූ වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම් ප්‍රදේශය පුරා පවතින භූගෝලීය සාධක ද භාවිත කරමින් ගොඩනැගුණු අතර සීඝ්‍ර ව්‍යාප්තියක් ද දක්නට ඇති බව හමුවන ස්මාරක සාධක අනුව නිගමනය කළ හැකිය. අධ්‍යයනය සඳහා බඳුන් කළ හැඩඔය සහ කරඳ ඔය ගංගා නිම්න අතර කලාපය ගත්විට එවන් පුරාවිද්‍යාත්මක නටබුන්වල විශාල පැතිරීමක් දක්වනු ලබන කලාපයක් වශයෙන් පෙන්වා දිය හැකිය. එම ගංගා නිම්න දෙක අතර පිහිටි තරුලෙන්ගල, මඟුල් මහා විහාරය, ඇත්ගාල, තුනේ කණුව, මුහුදු මහා විහාරය, ශාස්ත්‍රවෙල යන පුරාවිද්‍යාත්මක ස්ථානයන්හි ඇති වාස්තුවිද්‍යාත්මක වශයෙන් වැදගත් වන ඉදිකිරීම්හි ඇති සුවිශේෂතා සහ ප්‍රාදේශීය ආවේණිකතා ගණනාවක් දක්නට ලැබිණ.

විධිමත් ආරාමික සංවිධානය යටතේ මඟුල් මහා විහාරය වඩාත් කැපී පෙනෙන පබ්බත විහාර යන සංවිධානාත්මක ආරාමික සැලසුම මත සංවර්ධනය වූ


JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka. jahs@ssh.rjt.ac.lk

ආයතනයක් වී තිබේ. ඒ තුළ ලංකාවේ අනෙකුත් එම සැලසුම අනුගමනය කර නිර්මාණය කළ විහාරවලට වඩා සුවිශේෂී වාස්තුවිද්‍යාත්මක අංග ගණනාවක් දක්නට ලැබේ. නිදසුනක් වශයෙන් ප්‍රධාන උපෝසථඝරයට අමතරව තවත් උපෝසථඝර ලක්ෂණ සහිත ඉදිකිරීම් දක්නට වීම හා ප්‍රධාන ස්තූපයට අමතරව වටදාගෙයක් සහිත ස්තූප ගොඩැල්ලක් ද හමුවීම මෙකී සුවිශේෂී බව සහ අනන්‍යතාවය ප්‍රකට කරවන අංග ලක්ෂණ වේ.

අව්ධිමත් විහාර ලෙස ඉදිකෙරුණු ස්ථාන වශයෙන් පර්යේෂකයා හඳුනාගනු ලැබුවේ පර්වත ආශ්‍රය කොටගෙන ඉදි වූ විහාර ය. ඒ අනුව තරුලෙන්ගල සහ ශාස්ත්‍රවෙල යන විහාරයන්හි අව්ධිමත් සංවිධාන ගතවීමක් දක්නට ලැබේ යැයි පවසනවාට වඩා ථේරවාදී බෞද්ධ පදනම මත එකී සංකල්පයන් මත පර්වතය ඉහළම මුදුනේ ස්ථූපයත් ක්‍රම ක්‍රමයෙන් පහලට වන්නට පිළිවෙලින් බෝධිඝරය, ලෙන් විහාරය ද පහතම කොටසේ සංඝාවාස ආදී වශයෙන් බෞද්ධ ආගමික සංකල්පීයමය රටාවක් අනුව ගොඩනැගිලි ස්ථානගත වී ඇති බව නිගමනය කළ හැක.

වාස්තුවිද්‍යාත්මක ඉදිකිරීම්හි දක්නට ලැබෙන ආවේණිකතාවයන් සහ සුවිශේෂිතතාවයන් පිළිබඳ සාකච්ඡා කරන විට අධ්‍යයන කලාපයෙන් බොහෝ දුරස්ථ වන්නට පිහිටි අනුරාධපුර අගනගරයේ ඇති ඉදිකිරීම් හා සංසන්දනය කර බලන කල ස්තූප, උපෝසථඝර, බෝධිඝර, ප්‍රතිමාගෘහ සහ නොයෙකුත් ඉදිකිරීම් තුළ හා ඒවායෙහි ඇති උපාංගවල කැපීපෙනෙන සුවිශේෂී ලක්ෂණ දක්නට ලැබිණ. ප්‍රතිමාගෘහයන්හි අධිෂ්ඨානවල ඇති බොරදම් රටා, චතුරස්‍රාකාර උපෝසථඝර සහ දෙපසින් වක්‍ර කරන ලද පදනමත් සහිත ගොඩනැගිලි මෙකී කලාපීය අනන්‍යතාවය ප්‍රකට කරවනු ලබයි.

පර්යේෂණ සීමාවේ තෝරාගත් විහාරයන් තුළ ප්‍රතිසංස්කරණයන් අල්ප වීම හෝ නොවීම මත එකී මුල් ලක්ෂණ ආරක්ෂා වී ඇත. තරුලෙන්ගල, ශාස්ත්‍රවෙල, ඇත්ගාල, කිරිවෙහෙර, තුනේ කණුව ආදී විහාර ගත්විට එහි ඇති ගොඩනැගිලි ප්‍රතිසංස්කරණයට බඳුන් නොවූ ගතිලක්ෂණ පෙන්නුම් කරන අතර බොහෝ ගොඩනැගිලිවල ඇති කුළුණු මුල්ම අවධීන්හි ස්වරූපයන් ගන්නා අතර රළු නිර්මාණ ය. පාෂාණයෙන් වෙන් කිරීමකදී හැර වෙනත් හැඩ ගැන්වීමක් හෝ සිදුකර නොමැති තරම් ය. කිහිපවාරයකදී ම සංවර්ධනය වූ බවට සාධක දක්නට ඇත්තේ මඟුල් මහා විහාරය තුළ පමණක් වන අතර එහි ප්‍රතිසංස්කරණ අවදි තුනක් පමණ දැකගත හැකිය. ඒ බැව් හමුවන සෙල්ලිපි සාධක මත තහවුරු වේ. මේ අනුව ගත්විට ලංකාවේ ඉදි වූ පැරණිතම ස්තූපයක හෝ ප්‍රතිමාඝරයක හෝ බෝධිඝරයක හෝ සංඝාවාසයක හෝ වෙනයම් ගොඩනැගිල්ලක හෝ ලෙන් විහාරයක හෝ මූලික ස්වරූපයන් පුරාවිද්‍යා ස්ථානවල දක්නට ලැබෙන අතර මෙම සුවිශේෂී තත්ත්වය අනුරාධපුර පෞරාණික අගනගරයෙන් පවා දැකගත නොහැකි ලක්ෂණයකි. මෙසේ අධ්‍යයන පරාසය තුළ ඇති විහාර තුළින් වාස්තුවිද්‍යාත්මක සුවිශේෂී සහ අනන්‍ය ආවේනිකතා ප්‍රකට කරවන බවත්, එම වාස්තුවිද්‍යා අංගයන්හි මුල් ස්වරූපයන් ආරක්ෂා වී ඇති බවත්, බෞද්ධ ආගමික සංකල්ප අනුව යමින් මෙහි ගොඩනැගිලි ස්ථානගත කර ඇති බවත් පෙන්වාදිය හැකිවේ.

## ආශ්‍රිත මූලාශ්‍ර


– Nicolos, C. W. (1963), "Historical Topography of Ancient and Medieval Ceylon". *Journal of Royal Asiatic Society (JRAS)*, volume VI. pp. 21-22.

– Silva, Roland (2006), *Environment, Town, Village and Monastic Planning*. Memories of the Archaeologial Survey of Ceylon. Volume X. Part II. Colombo: The Department of Archaeology.

– Silva, Roland (2004), "A Buddhist Monastery type of Ancient Ceylon showing Mahayanist Influence". *Ancient Ceylon* No:22.

– Wijesuriya, Gamini (1998), *Buddhist Meditation Monasteries of Ancient Sri Lanka*. Memories of the Archaeological Survey of Sri Lanka. Volume 10. Colombo: Department of Archaeology.

– Seneviratna. Anuradha (1994), *Ancient Anuradhapura.* Colombo: Archaeological Survey Department.

– Silva. W. De. (2017), "Nature and Buddhist Architecture: Sri Lanka". *International Journal of Design, Nature and Economics.* Volume 12 No 02, pp. 225-234.

– Dharmarathna. Sumudu. (2022), "Mahayana-Tantrayana Traditions and Transition of Monastic Architecture in Ancient Sri Lanka". *Journal of The Center for Indigenous Knowledge and Community Studies.* Volume 7 Issue 01.

– කාරියවසම්. තිස්ස (2007), *මහාවංශය-විස්තරාත්මක ප්‍රස්තාවනාවක් සහිත නව සංස්කරණය.* මරදාන: එස්. ගොඩගේ සහ සහෝදරයෝ (1989).

– මෙධානන්ද. එල්ලාවල (2013), *නැගෙනහිර පළාත හා උතුරු පළාතේ සිංහල බෞද්ධ උරුමය.* මරදාන: දයාවංශ ජයකොඩි සහ සමාගම.




*JAHS © Department of Archaeology and Heritage Management, Faculty of Social Sciences and Humanities, Rajarata University of Sri Lanka.* jahs@ssh.rjt.ac.lk

- මෙධානන්ද. එල්ලාවල (2008), *මාගම රාජධානිය.* මරදාන: දයාවංශ ජයකොඩි සහ සමාගම.

- මෙධානන්ද. එල්ලාවල (2012), *ශාස්ත්‍රවෙල මණිනාග පබ්බත බෝධිගිරි විහාරය.* සපරගමු ඉතිහාස-පුරාවිද්‍යා පර්යේෂණ ආයතනය.

- මෙධානන්ද. එල්ලාවල (2016), *ගවේෂණ තුළ ගවේෂණ.* මරදාන: දයාවංශ ජයකොඩි සහ සමාගම.

- බණ්ඩාරනායක. සේනක (1985), ලාංකික බෝධිඝරය. *වසුන්දරා-පුරාවිද්‍යා ශිෂ්‍ය සංගමයේ ශාස්ත්‍රීය සංග්‍රහය-*දෙවන කලාපය. කැලණිය විශ්වවිද්‍යාලයීය පුරාවිද්‍යා ශිෂ්‍ය සංගමය. කැලණිය: කැලණිය විශ්වවිද්‍යාලය.

- ගමලත්. දනන්ජය (2016), *ප්‍රාතිමෝක්ෂ සහ උපෝසථඝරයේ වාස්තුවිද්‍යා ව්‍යවච්ඡේදනය.* නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

- ගමලත්. දනන්ජය (2016), ශ්‍රී ලාංකේය බුද්ධ ප්‍රථිමා අධිෂ්ඨාන බොරදම් රටා විශ්ලේෂණය (ක්‍රි.ව. 2-3 සියවසේ සිට 12වන සියවස දක්වා. *Ancient Ceylon. No:25 July 2016.*

- ගමලත්. දනන්ජය (2016), ප්‍රතිමාගෘහය තුළ බුද්ධ හා බෝධිසත්ත්ව ප්‍රතිමා තැන්පත් කිරීමේ ක්‍රමවේදය, අනුරාධපුර හා පොළොන්නරු යුගවලට අයත් නිදසුන් ඇසුරෙන්. *The Journal of Archaeology and Heritage Studies.* Volume 3-issue 1.

- කුලතුංග, ටී. ජී. (2014), *පුරාණ අභයගිරි විහාරය.* මධ්‍යම සංස්කෘතික අරමුදල. කොළඹ 07: මධ්‍යම සංස්කෘතික අරමුදල මුද්‍රණාලය.

- කුලතුංග. ටී. ජී. (2018), *අනුරාධපුර මහා විහාරය.* නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

- වික්‍රමගමගේ. චන්ද්‍රා (1995), *ශ්‍රී ලංකාවේ පැරණි ගොඩනැගිලි දොරටු.* කොළඹ: ශ්‍රී ලංකා සංස්කෘතික ශාස්ත්‍රායතනය.

- වික්‍රමගමගේ. චන්ද්‍රා (2010), *ස්තූප.* කතෘ ප්‍රකාශන.

- විතානාච්චි චන්දන රෝහණ 2013 *පෞරාණික ස්ථාන සහ ස්මාරක - අම්පාර දිස්ත්‍රික්කය, කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේනතුව.*

- බෝපෙආරච්චි. ඔස්මන්. පරි: ගුණවර්ධන. නදීෂා (2020), *ශ්‍රී ලාංකේය මූර්ති කලාවේ පදනම,* කොළඹ: පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

- මද්දුමාගේ. මිල්ටන් (2005), *ශාස්ත්‍රීය නිබන්ධන (පුරාවිද්‍යා).* බණ්ඩාරගම: කතෘ ප්‍රකාශන.

- කහඳගමගේ. පියසේන (2007), *දිගාමඩුලු දනව්ව.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

- සුසීම. දීඝවාපියේ (2011), *දිගාමඩුලු වන්දනා ගමන් මග.* අම්පාර: බුද්ධංගල ආරණ්‍ය සාධක සමිතිය.

- අඹන්වල. චන්දිම බණ්ඩාර සහ වීරවර්ධන. සුමේධ (2014), *ලාහුගල කොටවෙහෙර හෙවත් දීගලක මහා විහාර වංශය.* මහනුවර: බුවනෙක ප්‍රකාශකයෝ.

- සඳරුවන්. චින්තක (2016), *පුරාවිතරණ ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

- සෝරත හිමි. අලූත්වැව (2014), *බෞද්ධ රෝහණය.* නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

- මනතුංග. සීවලී බණ්ඩාර(2005), කල්‍යාණි කණ්ණිකා හෙවත් පුරාණ නැගෙනහිර කැලණියේ පුරාවිද්‍යා අවශේෂ. *පුරාතන-ශාස්ත්‍රීය ලේඛණ සංග්‍රහය.* කොළඹ 07: මධ්‍යම සංස්කෘතික අරමුදල.

- සුමන හිමි. බෝගහමුල්ලේ සහ දිසානායක. ලාහුගල පී. බී. (2011), *ලාහුගල මඟුල් මහා විහාරය හෙවත් රුහුණේ මහා විහාරය.* නැගෙනහිර බෞද්ධ පුනරාගමනය.

<u>වාර්තා</u>

- ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, පුරාවිද්‍යා ගවේෂණ වාර්තාව (අප්‍රකාශිත), පුරාවිද්‍යා කලාප කාර්යාලය. අම්පාර.

- පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, පුරාවිද්‍යා ගවේෂණ වාර්තාව (අප්‍රකාශිත), පුරාවිද්‍යා කලාප කාර්යාලය. අම්පාර.

- ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දැනට හඳුනාගෙන ඇති පුරාවිද්‍යා ස්ථාන පිළිබඳ තොරතුරු(අප්‍රකාශිත), මධ්‍යම සංස්කෘතික අරමුදල. අම්පාර ව්‍යාපෘතිය (2017).

- මඟුල් මහා විහාර ව්‍යාපෘති යෝජනාව (අප්‍රකාශිත), මධ්‍යම සංස්කෘතික අරමුදල. අම්පාර ව්‍යාපෘතිය (2017).

- කිරිවෙහෙර ස්තූප කැණීම් වාර්තාව (අප්‍රකාශිත), මධ්‍යම සංස්කෘතික අරමුදල. අම්පාර ව්‍යාපෘතිය (2017).